රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

அரசாங்க நிருவாகச் சுற்றறிக்கை

Public Administration Circular

අංක
இல.
No.
} 52

# වයස අවුරුදු 55 ඉක්මවූ රජයේ සේවකයින් රජයේ මණ්ඩලවලට හා සංස්ථාවලට පත් කිරීම

## 55 வயது கடந்த அரசாங்க சேவையாளர்களை அரசாங்கச் சபைகளுக்கும் யாக்கங்களுக்கும் நியமித்தல்

# Appointment of Public Servants who have passed the age of 55 to Public Boards and Corporations

ආයතන චක්‍රලේඛ මාලා අංක
தாபனத் தொடர் இல.
Establishments Series No.
} 40

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

මිල விலை Price: -/10 cts. තැපැල් ගාස්තුව தபாற் செலவு Postage: -/15 cts.

මගේ අංකය : 2/3/? (...) [illegible]

1972 මැයි මස 4 වැනි දින,
කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන, පළාත්පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශයේ දී ය.

සියලුම ස්ථිර ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ය.

**වයස අවුරුදු 55 ඉක්මවූ රජයේ සේවකයින් රජයේ මණ්ඩලවලට හා සංස්ථාවලට පත් කිරීම**

වයස අවුරුදු 55 ඉක්මවූ රජයේ සේවකයින් හා රාජ්‍ය අංශයේ වෙනත් සේවකයින් විශ්‍රාම ගැන්වීම ගැන වූ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 37 බලනු මැනවි.

2. එම චක්‍ර ලේඛයෙහි සඳහන් පරිදි, පොදු නියමයන් වශයෙන්, රජයේ සේවකයින්ට ඔවුන්ගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වූ පසු සේවා දීර්ඝ කිරීම් නොදිය යුතු අතර, රාජ්‍ය අංශයේ මණ්ඩලවල හා සංස්ථාවල සේවකයින්ට වයස අවුරුදු 60 සම්පූර්ණ වන තුරු සේවය කරගෙන යාමට ඉඩ දිය හැකිය.

3. වයස අවුරුදු 55 සම්පූර්ණ වීමට ළඟාවී සිටින නැතහොත් වයස අවුරුදු 55 සම්පූර්ණ වී සිටින ඇතැම් රජයේ සේවකයින් මණ්ඩලවලට හා සංස්ථාවල කාර්යමණ්ඩලයට බඳවා ගනු ලබන බවත්, එසේ බඳවා ගනු ලැබීමෙන් පසු වයස අවුරුදු 60 වන තෙක් සේවය කර ගෙන යාමට ඉඩදෙනු ලැබ ඇති බවත්, රජයේ අවධානයට ලක් කෙරී තිබේ. එහෙයින් ව්‍යවස්ථාපිත මණ්ඩල හා සංස්ථා, මින් ඉදිරියට වයස අවුරුදු 55 ඉක්මවූ හෝ, වයස අවුරුදු 55 සම්පූර්ණ වීමට පෙරාතුව, විශ්‍රාම ගැන්වීමේ නිවේදනය ලබා ඇති හෝ රජයේ සේවකයින්—

(i) තනතුරට පත්කළ හැකි සුදුසු සේවකයෙකු අදාළ මණ්ඩලයේ හෝ සංස්ථාවේ සේවයෙහි නැත්නම් ; හා

(ii) වයස අවුරුදු 55 ඉක්මවූ විශ්‍රාම ලත් රජයේ සේවකයෙකු හෝ වයස නිසා විශ්‍රාම ගන්වනු ලැබීමේ නිවේදනය ලබා ඇති රජයේ සේවකයෙකු හැරෙන්නට මණ්ඩලයේ හෝ සංස්ථාවේ තනතුරට පිටස්තරින් බඳවා ගතහැකි සුදුසු පුද්ගලයෙකු නැති බව, තනතුර පළ කරනු ලැබීමෙන් පසු, පෙනී ගොස් ඇත්නම්—

මිස සේවයට බඳවා නොගතයුතු යයි තීරණය කෙරී ඇත.

4. ඉහත 3 වැනි ඡේදයේ දක්වෙන කොන්දේසි අනුව කටයුතු කර ඇත්නම් මිස, වයස අවුරුදු 53 ට වැඩි රජයේ සේවකයෙකු ව්‍යවස්ථාපිත මණ්ඩලයකට හෝ සංස්ථාවකට තාවකාලිකව හෝ ස්ථිරව බඳවා නොගත යුතුයයි ද තීරණය කෙරී ඇත.

රාජ්‍ය පරිපාලන, පළාත්පාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

---

කේ 14049—10,009 (6/72)